# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**10 ශ්‍රේණිය**

## භූගෝල විද්‍යාව - I

නම/ විභාග අංකයඃ ……………………………………  කාලය පැය 1 යි

- **මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විතය.**
- **සපයා ඇති උපදෙස් අනුව මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

---

✶ **අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්නග**

01) පෘථිවි පද්ධතියේ උප පද්ධති අතර ජීවයක් සහිත කොටස ………………………….. නමින් හඳුන්වයි.
(ජල ගෝලය / වායු ගෝලය / ජෛව ගෝලය)

02) ප්‍රාවරණය සහ හරය වෙන් කරන සීමාව ………………………….. අසන්තතිය ලෙස හඳුන්වයි.
(මොහොරවිසික් / කොන්රඩ් / ගුටෙන්බර්ග්)

03) උන්නතාංශය සමඟ උෂ්ණත්වය ක්‍රමයෙන් ඉහළ යාම ………………………….. ගෝලයේ විශේෂ ලක්ෂණයකි. (පරිවර්ති / තාප / අපරිවර්ති)

04) සූර්යාගෙන් පොළොවට පතිත වන ………………………….. කිරණ උරා ගන්නා ඕසෝන් ස්ථරය පිහිටා ඇත්තේ අපරිවර්ති ගෝලයේ ය.
(අධෝරක්ත කිරණ / පාරජම්බුල කිරණ / සූර්ය කිරණ)

05) ප්‍රාවරණය තුළ ක්‍රියාත්මක වන ………………………….. වල බලපෑම නිසා භූ තැටි චලනය වේ.
(භූමිකම්පා / සංවහන ධාරා / සම්පීඩන බලවේග)

06) ඕස්ට්‍රේලියා මහද්වීපික තටකය තුළ පිහිටි දූපතකට නිදසුනක් වන්නේ ………………………….. දූපතය.
(බෝර්නියෝ / තස්මේනියාව / ජාවා)

07) දකුණු පලාතට අයත් ………………………….. ශ්‍රී ලංකාවේ සුළු පොල් ත්‍රිකෝණයට අයත් ප්‍රදේශයකි.
(මාතර / තංගල්ල / ගාල්ල)

08) ශ්‍රී ලංකාවේ තේ වගා කරන දිස්ත්‍රික්ක අතරින් මැදරට තේ වගාව සඳහා ………………………….. දිස්ත්‍රික්කය වැදගත් වේ. (නුවරඑළිය / රත්නපුර / බදුල්ල)

09) පෘථිවියේ ගොඩබිමේ ඇති ජල ප්‍රමාණයෙන් සියයට ………………………….. පමණ අයිස් තට්ටු හා ග්ලැසියර්වල මිදුණු ජලය ලෙස පවතී. (79% / 97.5% / 71%)

10) 1:50 000 භූ ලක්ෂණ සිතියමක දැක්වෙන ………………………….. සංස්කෘතික ලක්ෂණයකට නිදසුනකි.
(වනාන්තර / වැව / ගංගා)

✶ **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් "නි" යන්න වටා ද වැරදි නම් "වැ" යන්න වටා ද රවුමක් අඳින්න.**

11) ලෝකයේ දේශගුණ ව්‍යාප්තිය පිළිබඳව මුල්ම අදහස ඉදිරිපත් කරනු ලැබුයේ ඇරිස්ටෝටල් විසිනි. **( නි / වැ )**

12) ජෛන්ද්‍රිය පොහොර ප්‍රචලිත කිරීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගෝනවල මාකඳුර කාබනික පොහොර මධ්‍යස්ථානය පිහිටුවා ඇත. **( නි / වැ )**

13) මහද්වීප අතර කුඩාම මහද්වීපය වන්නේ ඇන්ටාක්ටිකා මහද්වීපයයි. **( නි / වැ )**

14) සාගරික කබොල මූලික වශයෙන් සිලිකා හා මැග්නීසියම් වලින් යුක්ත වේ. **( නි / වැ )**

15) සුවිශේෂී කරුණක් දැක්වීම සඳහා පමණක් නිර්මාණය කර ඇති සිතියම් හු ලක්ෂණ සිතියම් වේ. **( නි / වැ )**

✶ **අංක 16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවල "අ" හා "ආ" වශයෙන් තීරු දෙකක් දැක්වේ. "අ" තීරයේ ඇති තොරතුරු අනුපිළිවෙළට අනුව "ආ" තීරුවේ ඇති තොරතුරු ගැලපූ විට නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

16) "අ" - කඳුවැටිය / "ආ" - පිහිටි මහද්වීපය

1. ඇට්ලස් — A- දකුණු ඇමරිකාව
2. අල්තායි — B- යුරෝපා
3. අන්දීස් — C- අප්‍රිකා

D- ආසියා

1) D C B 2) C D A 3) D C A 4) B D A

(………)

17) "අ" - ප්‍රධාන සාගර / "ආ" - මුහුද

1. පැසිපික් සාගරය — A- කැරිබියන් මුහුද
2. අත්ලන්තික් සාගරය — B- බැරන්ට්ක් මුහුද
3. ඉන්දියන් සාගරය — C- කහ මුහුද

D- අරාබි මුහුද

1) C A D 2) C A B 3) D B C 4) B C A

(………)

18) "අ" - මහද්වීපික තටකය / "ආ" - දූපත

1. ආසියා මහද්වීපය — A- පැපුවා නිව්ගිනියා
2. ඕස්ට්‍රේලියා මහද්වීපය — B- ජැමෙයිකා
3. අප්‍රිකා මහද්වීපය — C- සුමාත්‍රා

D- මැඩගස්කරය

1) A D B 2) A B D 3) C A D 4) C A B

(………)

19) "අ" - තේ වර්ගය / "ආ" - තේ වගා ප්‍රදේශය

1. උඩරට තේ — A- රත්නපුර
2. මැදරට තේ — B- මාතලේ
3. පහතරට තේ — C- ගම්පහ

D- නුවරඑළිය

1) D B C 2) D BA 3) C D B 4) A C D

(………)

20) "අ" - ගංගා නිම්නය | "ආ" - රට

1. මරේ ඩාලිං ගංගා නිම්නය — A- ඇමරිකා එක්සත් ජනපදය
2. සැක්‍රමැන්යෝ ගංගා නිම්නය — B- චීනය
3. ජේ ගංගා නිම්නය — C- ඕස්ට්‍රේලියාව
   D- ඉතාලිය

1) C A D  2) A C B  3) C D A  4) B D A
(………)

★ **අංක 21 සිට 30 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදු වාක්‍ය සම්පූර්ණ කරන්න.**

21) මින්ඩනාඕ සහ මරියානා ආගාධ පිහිටා ඇත්තේ ……………………………… සාගරයේ ය.

22) ලෝකයේ විශාලතම විල ……………………………… විලය.

23) පරිවර්ති මණ්ඩලය ……………………………… ගෝලයේ ඉහළ සීමාව වේ.

24) ආදර්ශ ගෝලයේ අක්ෂාංශ 0° රේඛාව ……………………………… ලෙස හැඳින්වේ.

25) ශිලා ගෝලය විශාල භූ තැටි ……………………………… සහ කුඩා භූ තැටි කිහිපයකින් යුක්ත වේ.

26) පෘථිවියේ මුළු භූමි ප්‍රමාණයෙන් ………………………………% ක් ගොඩබිම වේ.

27) හිමාලය කඳු පන්තියේ ඇති ……………………………… සානුව වඩාත් උසින් පිහිටි සානුවයි.

28) දඹදෙණිය ……………………………… අපනයන ගම්මානයක් ලෙස හඳුන්වා ඇත.

29) මහද්වීපික මායිමේ සිට සාගරය දෙසට නෙරාගිය නොගැඹුරු මුහුද ……………………………… ලෙස හැඳින්වේ.

30) සුපර්සොනික් ජෙට් යානා පියාසර කරන්නේ ……………………………… ගෝලයේ මධ්‍ය ප්‍රදේශය තුළය.

★ **අංක 31 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

31) ශ්‍රී ලංකාවේ කෘෂි අපනයන මණ්ඩලය ආරම්භ කළ වර්ෂය වනුයේ
1) වර්ෂ 1972  2) වර්ෂ 1977  3) වර්ෂ 2005  4) වර්ෂ 2010
(………)

32) අභ්‍යවකාශයේ සිට පෘථිවියට පැමිණෙන උල්කාෂ්ම බොහොමයක් දැවී විනාශ වන්නේ
1) පරිවර්ති ගෝලය තුළදීය  2) අපරිවර්ති ගෝලය තුළදීය
3) තාප ගෝලය තුළදීය  4) මෙසෝ ගෝලය තුළදීය
(………)

33) අර්ධ වශයෙන් ගොඩබිමෙන් වටවූ මුහුදකි.
1) ඒරල් මුහුද  2) අරාබි මුහුද  3) චීන මුහුද  4) රතු මුහුද
(………)

34) සාගරික භූ තැටියක් ලෙස හඳුන්වන්නේ
1) අප්‍රිකානු තැටිය යි  2) පැසිපික් තැටිය යි
3) යුරේෂියානු තැටිය යි  4) ඉන්දු ඕස්ට්‍රේලියානු තැටිය යි
(………)

35) වර්ෂණය, උෂ්ණත්වය, පීඩනය, සුළං, ආර්ද්‍රතාවය, වළාකුළු වර්ධනය වැනි සියලු කාලගුණික සංසිද්ධීන් සිදුවන ස්ථරය වන්නේ
1) පරිවර්ති ගෝලයයි  2) අපරිවර්ති ගෝලයයි
3) මෙසෝ ගෝලයයි  4) තාප ගෝලයයි
(………)

36) ලෝකයේ කිරිපට්ටි පාලනයේ යෙදෙන දක්ෂිණාර්ධ ගෝලයේ රටක් වන්නේ

1) නවසීලන්තය 2) මෙක්සිකෝව 3) චීනය 4) ඩෙන්මාර්කය

(………)

37) ආදර්ශ ගෝලයේ දකුණු අක්ෂාංශ $66\frac{1}{2}°$ හඳුන්වන්නේ

1) මකර නිවර්තනය ලෙසය 2) කර්කටක නිවර්තනය ලෙසය
3) ඇන්ටාක්ටික් වෘත්තය ලෙසය 4) ආක්ටික් වෘත්තය ලෙසය

(………)

38) ලෝකයේ ස්වභාවික රබර් නිෂ්පාදනයෙන් 95% ක්ම සපයනු ලබන්නේ

1) බ්‍රසීලය යි 2) ඇමරිකා එක්සත් ජනපදය යි
3) බටහිර අප්‍රිකානු රටවල් ය 4) දකුණු හා අග්නිදිග ආසියානු රටවල් ය

(………)

39) අවුරුද්ද මුළුල්ලේ ම ඉහළ උෂ්ණත්වයක් පැවතීම, අවුරුද්ද පුරා පැතිරුණු වර්ෂාපතනය, වර්ෂාපතනයේ විවිධත්වයන් පැවතීම මෙම ලක්ෂණ ඇතුළත් දේශගුණ වර්ගය වන්නේ

1) නිවර්තන දේශගුණය 2) සෞම්‍ය දේශගුණය
3) මධ්‍යධරණී දේශගුණය 4) ශීත දේශගුණය

(………)

40) ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තයෙන් දළ දේශීය නිෂ්පාදිතයට සිදුවන දායකත්වයේ ප්‍රතිශතය වන්නේ

1) 10.1% පමණ 2) 11.1% පමණ 3) 21.1% පමණ 4) 12.1% පමණ

(………)